JMC vLearning
"your virtual learning partner"

# එකතු කල අගය මත බදු
# Value Added Tax

තුෂාර ඉංදික ජයවීර

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

## නීතිමය රාමුව

2002 අංක 14 දරණ පනත හා ඊට අදාල සංශෝධන පනත් වලට යටත්ව ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වන ප්‍රධානතම වක්‍ර බදු ක්‍රමය එකතු කල අගය මත බදු ක්‍රමයයි.

මෙම බදු ක්‍රමය තුලදී පහත ආවරණ තත්ත්වයන් වැදගත් වෙයි.

1. බද්දට යටත් වන්නේ කවුරුන්ද?
2. ලියාපදිංචි විය යුතු සීමාවන් මොනවාද?
3. බද්ද ගණනය කරන ආකාරය සහ අදාල අනුපාත
4. බදු ගෙවීම් සිදු කල යුතු දිනයන්
5. බදු වාර්තා ඉදිරිපත් කල යුතු දිනයන්
6. හරපත් සහ බැරපත් මත ගැලපීම්
7. සරල කල එකතු කල අගය මත බදු ක්‍රමය
8. බදු විලම්භනය කල හැකි අවස්ථා
9. යෙදවුම් බදු සඳහා සීමාවන්
10. බදු නිදහස් සැපයුම් (භාණ්ඩ සහ සේවාවන්)

ඒ අනුව ඉහත ගැටළු එකිනෙකට පිලිතුරු සොයා බලමු.

### 1. බද්දට යටත් වන්නේ කවුරුන්ද?

සරලව වටහා ගතහොත් ශ්‍රී ලංකාව තුල,

i. බදු අයකල හැකි ක්‍රියාකාරකමක් සිදු කරන
ii. ලියා පදිංචි තැනෙත්තෙකු

එකතු කල අගය මත බදු ක්‍රමයට යටත් වෙයි.

- ඒ අනුව බදු අය කල හැකි ක්‍රියාකාරකම් වන්නේ,
  - වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රකෂාවක් කරගෙන යාම
  - සේවා සැපයීම
  - ඉහත ක්‍රියාකාරකම් වෙනුවෙන් කටයුතු ආරම්භ කිරීම හෝ නවතා දැමීම.
  - කුලී පිට හෝ කල් බදු ගණුදෙනු
  - ආනයන අපනයන වෙළඳාම
  - නිශ්චිත තත්වයන් යටතේ තොග හා සිල්ලර වෙළඳාම

- ලියාපදිංචි තැනෙත්තෙකු යනු එකතු කල අගය මත බදු පනත් යටතේ,
  - අනිවාර්ය ලියාපදිංචි හෝ
  - කොමසාරිස්වරයා විසින් ලියා පදිංචි කල හෝ
  - ස්වේච්ඡාවෙන් ලියා පදිංචි වූ තැනෙත්තෙකි.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## 2. ලියාපදිංචි විය යුතු සීමාවන් මොනවාද?

- කාර්තුවක බදු අයකල හැකි සැපයුම් වටිනාකම (නිදහස් හැර) රු. 3,000,000 (මිලියන 3) වැඩි සැපයුම්කරුවන් හෝ
- වාර්ෂික බදු අයකල හැකි සැපයුම් වටිනාකම රු. 12,000,000 (මිලියන 12) වැඩි සැපයුම්කරුවන්
- අපනයනකරුවන් - (ගමන් මලු හැර)
- ආනයනකරුවන් - (ගමන් මලු හැර)
- තොග හා සිල්ලර වෙළඳාමේ දී කාර්තුවක බදු අයකල හැකි සැපයුම් වටිනාකම රු. 12,500,000 (මිලියන 12.5) වැඩි සැපයුම්කරුවන් - මෙම සීමා ඉක්මවන විට ලියාපදිංචි විය යුතුය.

## 3. බද්ද ගණනය කරන ආකාරය සහ අදාල අනුපාත

සරලව ප්‍රකාශ කළහොත් එය පහත පරිදිය.

| | |
|---|---|
| බද්දට යටත් සැපයුම් වටිනාකම x නිමැවුම් බදු අනුපාතය | = xxxx නිමවුම් බද්ද |
| අඩුකලා යෙදවුම් බදු (හිලව් කල හැකි අගය) | =(xxx) |
| ගෙවිය යුතු එකතු කල අගය මත බද්ද | = xxx |

විභාගයේදී ගණනනය කිරීම පහත පරිදි සිදු කරයි.

| | | |
|---|---|---|
| බද්දට යටත් සැපයුම් වටිනාකම x නිමැවුම් බදු අනුපාතය | | = xxx |
| අඩුකලා - හිලව් කල හැකි යෙදවුම් බද්ද | | = (xxx) |
| | | xxx |
| වාරික ගෙවීම් | 1 | |
| | 2 | |
| | 3 | = xxx |
| ගෙවිය යුතු ඉතිරි බද්ද | | xxx |

➢ මෙහිදී අදාල බදු අනුපාත වන්නේ,

1. සම්මත අනුප්‍රමාණය Standard Rate = 15%
2. ශූන්‍ය අනුප්‍රමාණය = 0%

❖ සැලකිය යුතුයි:

නිමැවුම සඳහා අදාල නොවන (නිදහස්) යෙදවුම් බදු සහ ගමන් සඳහා භාවිතා කරන මෝටර් රථ සඳහා අදාල යෙදවුම් බදු හිලව් කල නොහැක.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## 4. බදු වාර්තා ඉදිරිපත් කල යුතු දිනයන්

- මාසික බදු වාර්තා සපයන්නන් එම මාසය අවසාන වී එළඹෙන මාසයේ අවසාන දිනට පෙර
- කාර්තුවක් වාර්තා සපයන්නන් කාර්තුව අවසාන වී එළඹෙන මාසයේ අවසාන දිනට පෙර
- මාසික වාර්තා සැපයිය යුතු අය,
  1. ශුන්‍ය අනුපාතික සැපයුම්කරුවන් - අපනයනකරුවන්
  2. අපනයන සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි සැපයුම්කරුවන් TQB

- කාර්තු වාර්තා සැපයිය යුතු අය

  ඉහත මාසික වාර්තා සපයන්නන් නොවන අනිකුත් තැනැත්තන්


## 5. හරපත් සහ බැරපත් මත ගැලපීම් (Adjustment for VAT Debit Note or Credit Note)

හරපතක් මඟින් පිළිඹිබු වන්නේ සැපයුම්කරුවකු අපවෙත නිකුත් කල බැරපතකි. එනිසා එකී ගැලපීම් යෙදවුම් බදු ගැලපීමේදී සිදුකල යුතුය.

බැරපතක් මඟින් අප වෙත ආපසු එවීමක් පිළිඹිබු කරන අතර එමඟින් නිමැවුම් බදු වෙනසක් සිදුවෙයි. එය නිමැවුම් බදු සඳහා යෙදවුම් බදු සමඟ ගැලපිය යුතුය.

## 6. සරල කල එකතු කල අගය මත බදු ක්‍රමය Suspended or Simplified VAT System – SVAT

මෙහිදි සැපයුම්කරුවන් ලියාපදිංචි සැපයුම්කරුවන් වශයෙන් සහ Registered Identified Supplier (RIS) නිමැවුම්කරුවන් ලියාපදිංචි ගැණුම්කරුවන් ලෙස Registered Identified Purchases (RIP) සරල කල එකතු කල අගය මත බදු ක්‍රමයට ලියාපදිංචි විය යුතුය. ඒ අනුව පහත ක්‍රියාවලිය සිදු වේ.




මේ නිසාවෙන් SVAT ඉන්වොයිසිය සඳහා VAT ගෙවීමක් නොකරයි. ඒ අනුව ගැණුම්කරු SVAT Credit Note නිකුත් කරයි. (දෙපාර්තමේන්තුව ලබාදුන්)

බදු ගණනයේදී

| | |
|---|---|
| SVAT ඉන්වොයිසියක නිමැවුම් බදු | xxx |
| යෙදවුම් බදු SVAT Credit Note | xxx |
| | — |

## 7. එකතු කල අගය මත බද්ද විලම්භනය (D:ftrment) (කල්දැමීම) කල හැකි අවස්ථා

අපනයන වෙළඳාමේ යෙදී සිටින සැපයුම්කරුවන්ට සහ SVAT ක්‍රමයට ලියාපදිංචි සැපයුම්කරුවන්ට මෙම විලම්භන පහසුකම ලබා ගත හැකිය.

JMC vLearning "your virtual learning partner"


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

❖ මෙමඟින් දින 60 සිට දින 90 ක කාලයක් දක්වා ගෙවිය යුතු එකතුකල අගය මත බද්ද කල් පසුකර ගෙවීම් අවස්ථාව අදාල සැපයුම්කරුට හිමි වේ.

## 8. යෙදවුම් බදු සඳහා සීමාවන්

නිමැවුම් සඳහා අදාල යෙදවුම් මත යෙදවුම් බදු හිලව් කල හැකි අතර එම හිලව් කිරීම නිමැවුම් බදු මුදල දක්වා සීමා වේ. වැඩිපුර ගෙවූ යෙදවුම් බද්දක් වෙතොත් එම අගය ඊලඟ කාලපරිච්ඡේදයට ඉදිරියට ගෙන ගොස් හිලව් කල හැකිය.

නිදහස් සැපයුම් හෝ ගමන් සඳහා භාවිතා කරන මෝටර් රථ වලට අදාල යෙදවුම් බදු හිලව් කල නොහැක.

මීට අමතරව පහත කරුණද වැදගත් වේ.

ලියාපදිංචි සැපයුම්කරුවකුගේ ඉන්වොයිසියක් වෙනස් කල නොහැකි අතර ඉන්වොයිසියක් නැතිවුවහොත් එහි පිටපතක් (Copy) "පිටපතක" යනුවෙන් සඳහන් කර ලබා ගත හැකිය. බදු ඉන්වොයිසි 2 ක් එකට ගණුදෙනුවකට නිකුත් කල නොහැක.

එමෙන්ම රේගු දෙපාර්තමේන්තුව නිකුත් කරන "රේගු භාණ්ඩ ප්‍රකාශය" Custom Goods Declaration CUSDEC බදු ඉන්වොයිසියක් ලෙස සලකයි.

- එකතු කල අගය මත බදු ඉන්වොයිසියක ඇතුලත් විය යුතු තොරතුරු
  1. ලියාපදිංචි සැපයුම්කරුගේ නම ලිපිනය සහ ලියාපදිංචි අංකය
  2. ගැණුම්කරුගේ නම සහ ලිපිනය
  3. බදු ඉන්වොයිසියේ දිනය සහ අනුක්‍රමික අංකය
  4. සැපයුම් විස්තර සහ සැපයුම් දිනය
  5. සැපයුම් ප්‍රමාණය පිළිබඳ තොරතුරු
  6. සැපයුම් වටිනාකම සහ ඒ මත එකතුකල අගය මත බද්ද
  7. "බදු ඉන්වොයිසි" "Tax Invoice" යන වචනය පැහැදිලිව තිබිය යුතුය.

### බදු නිදහස් සැපයුම් (භාණ්ඩ සහ සේවා)

- බදු නිදහස් සැපයුම් සහ ආනයන
  1. තිරිඟු සහ තිරිඟු පිටි
  2. ඖෂධ
  3. ආයුර්වේද නිෂ්පාදන
  4. පොත් පත් (චෙක් පොත්, සඟරා, වාර ප්‍රකාශන, පුවත් පත්, දින පොත්, ලෙජර් පොත් සහ අභ්‍යාස පොත් හැර )
  5. බොරතෙල්, භූමිතෙල්, ගෑස් , ගුවන් යානා තෙල් , ඩීසල්
  6. ජංගම දුරකථන
  7. කෘෂිකර්ම බීජ
  8. පරිගණක සහ උපාංග
  9. සූර්ය බල පද්ධතිය
  10. අධිතාක්ෂණික උපකරණ
  11. පෙට්‍රල්, තාර සහ ගල් අඟුරු


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

12. ලොරි රථ, බස් රථ

- බදු නිදහස් සැපයුම් සේවා
  1. අධ්‍යාපනික සේවා සැපයීම.
  2. පොදු මගී සේවා (ගුවන් , ජලය , සංචාරක හා කුලී රථ සේවා හැර)
  3. විදුලි බලය සැපයීම.
  4. සේවකයන්ට ලබා දෙන ආහාර සහ ප්‍රවාහන පහසුකම්.
  5. නිවාස පහසුකම් සැපයීම. (නිවාස කුලියට දීම)
  6. වෛද්‍ය සේවා සැපයීම.
  7. සැපයුම් නොකල කෘෂිකාර්මික නිෂ්පාදන
  8. දේශීය දියර කිරි සැපයුම් හෝ දේශීය කිරිපිටි සැපයීම.
  9. දේශීය සීනී නිෂ්පාදනය
  10. දේශීය නිෂ්පාදන ආභරණ
  11. දේශීය සැකසූ මෘදුකාංග
  12. තීරු බදු රහිත සාප්පු සංකීර්ණ සැපයුම්

JMC vLearning
© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd